පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.28 පැය 0725 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 858 /2025 |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | | | |


<u>**පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**</u>

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.04.27 වන දින සවස් කාලයේ මාලඹේ පොලිස් වසමේ උඩවත්ත මාගර්යේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 23 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාලඹේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන කඩුගොඩ, දකුණ වග ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලඹේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.04.27 වන දින උදෑසන කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ ආලෝක සංඥා හන්දිය අසලදී පොලිස් විශේෂ කාර්‍ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 1800 ක් සන්තකයේ තබාගෙන කාර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු කාර් රථයද සමග අත්අඩංගුවට ගෙන මාලිගාවත්ත** පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ඉල්ලුප්පුකඩවායි කඳවුර.**

2025.04.27 වන දින රාත්‍රී කාලයේ මන්නාරම පොලිස් වසමේ පුදුකුඩිරිප්පු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා ඉල්ලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 01 යි ග්‍රෑම් 400 ක් හා ජංගම දුරකථනයක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 55 ක් වන පේසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව තේක්ක කඳන් 05ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මහඔය පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.**

2025.04.27 වන දින උදෑසන කාලයේ මහඔය පොලිස් වසමේ විලතලාව ප්‍රදේශයේදී මහඔය පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව තේක්ක වගර්යේ දැව කඳන් 05 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන ඇහැලගස්පල්ල, මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.